පටුන

දැක්ම, මෙහෙවර හා සාරධර්ම (1)

ආයතන ආකෘතිය (2-3)

සංධිස්ථාන (4)

මූල්‍යමය ඉස්මතුකිරීම් (5)

මෙහෙයුම් ඉස්මතුකිරීම් (6-8)

සභාපතිතුමාගේ සමාලෝචනය (9)

බාන්ඩික තොරතුරු (10)

අධ්‍යක්ෂ මණ්ඩලය (11)

කළමනාකරණ කණ්ඩායම (12)

ඒකාබද්ධ පාලනය (13)

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය (14)

මූල්‍ය වාර්තාව

ස්වාධීන විගණන වාර්තාව (15 - 27)

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (28)

විස්තීරණ ආදායම් ප්‍රකාශය (29)

කොටස් වෙනස්කම් ප්‍රකාශය (30)

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය (31)

ගිණුම්කරණ ප්‍රතිපත්ති (32-45)

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් (46-57)

දශ වර්ෂ සාරාංශය (58-59)

වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය

නියෝජිත ආකෘති පත්‍රය

ආයතනික තොරතුරු

දැක්ම

සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින් වතු කර්මාන්තයේ වඩාත්ම අභියෝගාත්මක තරඟකරුවා වීම

මෙහෙවර

ජාතික අවශ්‍යතා ආරක්ෂාකාරීව මෙහෙයවන අතරතුර සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම තුලින් සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

සාරධර්ම

හොඳම සේවා යෝජකයා: ගුණාත්මක නිෂ්පාදනය, ව්‍යවසායකත්වය, අගය නිර්මාණය කිරීම, ලාභදායීතාවය, පරිසර හිතකාමීත්වය සහ ආයතනික සමාජ වගකීම කෙරෙහි අවධානය යොමු කරමින් අවංක, සුදුසුකම් ලත් සහ කැපවූ කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම

තත්ත්ව සැපයුම්කරු: උසස් පාරිභෝගික තෘප්තිය සහ අප කරන සෑම දෙයක්ම අකණ්ඩව වැඩිදියුණු කිරීම

නිෂ්පාදකතාව: ඒකක සම්පත් යෙදවුම් සඳහා ප්‍රශස්ත නිෂ්පාදකතාවයක් ළඟා කර ගැනීම, හෙක්ටෙයාරයකට ඉහළම අස්වැන්නක්, තිරසාර පදනමක් මත ප්‍රශස්ත ඉඩම් පරිහරණය, නාස්තිය අවම කිරීම

ව්‍යවසායකත්වය: සෑම විටම අගය නිර්මාණය කිරීමට නව ප්‍රවේශයන් කල් තියා නව්‍යකරණය කිරීම: ව්‍යාපාරික පරිසරයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අඛණ්ඩව ප්‍රතිචාර දක්වයි.

ලාභදායීතාවය: ප්‍රාථමික නිෂ්පාදනය සහ අගය එකතු කල නිෂ්පාදන සඳහා ප්‍රශස්ත ශුද්ධ විකුණුම් සාමාන්‍යය සහ හැකි අවම නිෂ්පාදන පිරිවැය ළඟා කර ගැනීම

පරිසර හිතකාමී බව: පරිසරයට අවම වශයෙන් හානි වන හෝ හානි නොවන පරිදි සම්පත් ලබා ගැනීම

සමාජ වගකීම: මිනිසුන් හා පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම, යහපාලනයට ගරු කිරීම

ආයතන ආකෘතිය

ඇල්කඩුව වැවිලි සමාගම 1993 ජූලි 23 වන දින 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජයට අයත් ආයතනයක් ලෙස පිහිට වූ සහ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි වූ සීමාසහිත වගකීම් සමාගමකි. 1987 දී අංක 23 දරණ රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණ පනත යටතේ පොදු සමාගම් බවට පත්කරනු ලබන විධිවිධානය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් කළමනාකරණය කරන ලද ඉඩම් පවරා ගැනීමෙන් සමාගම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ රන් කොටස් හිමියා වන තනි කොටස් හිමියන්ගේ සමාගමක් ලෙස සමාගම ක්‍රියාත්මක වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය ‘‘ජනවතු පියස’’, අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් කළමනාකරණය වන කැලෑබොක්ක රාජ්‍ය වතුයායේ කොටසක් 2 ක් හා පහත සඳහන් වතු 10 ක් සහ පවරා ගෙන ඇල්කඩුව වැවිලි සමාගම පිහිටුවීම පිළිබඳ දැන්වීම 1993 ජූලි අංක 776/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඇල්කඩුව වැවිලි සමාගම සඳහා සත්‍ය භූමිය වෙන් කිරීම (අති විශේෂ ගැසට් නිවේදන අංක 776/13 – 1993 ජූලි 13) පහත පරිදි වේ.

සටහන 01

වතුයාය/ පිහිටීම	දිස්ත්‍රික්කය	භෝග	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර්) යොමු අංක 1
1. බණ්ඩාරපොළ, අලවත්ත	මාතලේ	තේ	283.00
2. ඇල්කඩුව, ඇල්කඩුව	මාතලේ	තේ සහ කරාබු	447.78
3. හුණුගල, ඇල්කඩුව	මාතලේ	තේ සහ කරාබු	264.73
4. පිටකන්ද, මාතලේ	මාතලේ	තේ	520.60
5. රත්වත්ත, උකුවෙල	මාතලේ	තේ සහ කරාබු	570.58
6. සේලගම, යටවත්ත	මාතලේ	තේ	255.00
7. හපුගස්පිටිය, මැටිහත්ත	මාතලේ	රබර්, කොකෝවා සහ ගම්මිරිස්	269.33
8. මිල්ලවාන, මැල්සිරිපුර	මාතලේ	පොල්, කොකෝවා, රබර්, ගම්මිරිස්	603.60
9. නාලන්ද, මඩවල උල්පොත	මාතලේ	රබර්, පොල් සහ ගම්මිරිස්	496.27
10. සෙල්ල ඔල්ල, පිහිඹුව	කුරුණෑගල අනු දිස්ත්‍රික්ක	රබර්, කජු සහ අඹ	358.00
11. කබරගල/ පෝන්ගල කොට්ටාසය (කැලෑබොක්ක රාජ්‍ය වතුයාය)	මාතලේ	දැව (යුකැලිප්ටස්)	217.00 (යොමු අංක 2)
එකතුව			**4,285.89**

ඇල්කඩුව වැවිලි සමාගම වෙත බදු දෙන ලද භූමි ප්‍රමාණය ඇති විශේෂ ගැසට් අංක 776/13 හි සඳහන් නොවන නිසා ඉහත සඳහන් කරන ලද දත්ත, සමාගම් ගිණුම් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ‘‘වතු ප්‍රතිසංස්කරණ ඒකකය’’ මගින් ලබා ගෙන ඇත.

සටහන 02

කැලෑබොක්ක වතුයායේ හෙක්ටෙයාර් 217කින් සමන්විත කබරගල සහ පෝන්ගල කොට්ටාස 1995 වසරේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වී ඇත.

ඇල්කඩුව වතු සීමාසහිත සමාගම 100% ක්ම මෙට්‍රොපොලිටන් ආයතනයට අයත් මෙට්‍රොපොලිටන් වතු පුද්ගලික සමාගම මගින් 1993 සිට පස් අවුරුදු ගිවිසුමක් මගින් කළමනාකරණය විය. මෙම ගිවිසුම කල් ඉකුත් වීමත් සමඟ මෙම ආයතනයේ කළමනාකරණය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් 1999 ජනවාරි 19 වන දින ලබා ගන්නා ලදී.

පාලක කොටස් වලින් 51% ක් විකුණා 1994 සිට ප්‍රාදේශීය වැවිලි සමාගම් වල අයිතිය පෞද්ගලීකරණය කිරීම රජය විසින් ආරම්භ කරන ලදී. 1994 සිට 2004 දක්වා කාලය තුල පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා අවස්ථා 6 කදී ඇල්කඩුව වතුයාය විකිණීමට ඉදිරිපත් කර ඇත. මෙට්‍රොපොලිටන් ඒජන්සි පුද්ගලික සමාගම හෝ වෙනත් කිසිදු ආයෝජකයෙකු පොදු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පිළිගත හැකි ආයෝජන සැලැස්මක් ඉදිරිපත් නොකළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇල්කඩුව වැවිලි සමාගම භාණ්ඩාගාරයට අයත් ප්‍රාදේශීය වැවිලි සමාගමක් ලෙස පැවතුනි.



සංධිස්ථාන

සංස්ථාපිත කිරීම - (1993 ජූලි 23) - කළමනාකරණ නියෝජිත - සී/ස මෙට්‍රොපොලිටන් ඒජන්සීස් පුද්ගලික සමාගම.

1993 අගෝස්තු මාසයේදී මෙහෙයුම් කාර්යාලය කොළඹට මාරු කරන ලදී. මුළු විධායක නිලධාරීන් 8 දෙනෙක් සහ කාර්ය මණ්ඩලය 30 දෙනෙක් කොළඹ පිහිටි කළමනාකරණ නියෝජිත ආයතනය වෙත මාරු වීමට එකඟ විය. අනෙක් අය ඉටු කිරීමට රාජකාරියක් නොමැතිව මාතලේ කාර්යාලයේ රැඳවිණි.

තේ වතු සඳහා කණ්ඩායම් ක්‍රමයක් හඳුන්වා දීම - 1994
බණ්ඩාරපොල, ඇල්කඩුව, හුණුගල සහ පිටකන්ද වතුයායන් පිටකන්ද කණ්ඩායම ලෙසද රත්වත්ත සහ සැලගම වතුයායන් රත්වත්ත කණ්ඩායම ලෙසද ඒකාබද්ධ කරන ලදී.

1999 ජනවාරි 19 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කළමනාකරණ නියෝජිත ලෙස කළමනාකරණය භාර ගන්නා ලදී. 2002 අගෝස්තු මාසයේදී විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය කප්පාදු කල නිසා තේ කර්මාන්තශාලා 3ක් වැසී ගියේය. මෙය වර්තමාන අර්බුදයට මූලිකම හේතුව ලෙස සලකයි. තේ කර්මාන්තශාලා වැසීමට අමතරව ඇල්කඩුව වැවිලි සමාගමේ තේ දළු පිටස්තර තේ කර්මාන්තශාලා වෙත අලෙවි කිරීමට සිදුවිය.

2004 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගමේ පාලනය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහ වැවිලි කළමනාකරණ අධීක්ෂණ ඒකකය මඟින් ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ පත්වීමත් සමඟ භාර ගන්නා ලදී.

2006 ජනවාරි මාසයේ සිට ආයතනය භාණ්ඩාගාරය මඟින් පත්වූ පූර්ණ කාලීන සභාපතිවරයෙකු සහ අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් කළමනාකරණය වේ. ඇල්කඩුව වැවිලි සමාගම විසින් බණ්ඩාරපොළ තේ කර්මාන්තශාලාව සී/ස ප්‍රයිඩ් ටී පුද්ගලික සමාගම වෙත අවුරුදු 30 කට බදු දෙන ලදී. ඒ අනුව ඇල්කඩුව වැවිලි සමාගම මඟින් නිෂ්පාදනය කරන තේ දළු වලින් වැඩි ප්‍රමාණයක් මෙම තේ කර්මාන්තශාලාව වෙත සපයන ලදී. 2002 තෙක් ක්‍රියාත්මක වූ ඇල්කඩුව වැවිලි සමාගමේ තවත් තේ කර්මාන්තශාලා දෙකක් විදුලි සැපයුම අත්හිටවීම නිසා වැසී ගියේය.

2008 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගම විසින් රත්වත්ත තේ කර්මාන්ත ශාලාව මූලිකව අවුරුදු 10ක් සඳහා APN පුද්ගලික සමාගම නමැති පෞද්ගලික ආයෝජකයෙක් වෙත බදු දෙන ලදී. එම ආයෝජකයා කර්මාන්තශාලාවේ අලුත්වැඩියාවන් සඳහා යොමු වී සිටියද තවමත් මෙහෙයුම් ආරම්භ කර නොමැත.

2013 වසරේදී ඇල්කඩුව වැවිලි සමාගම විසින් රත්වත්තේ වතුයායට අයත් පන්සල්තැන්න තේ කර්මාන්තශාලාව සී/ස EOAS ඔර්ගනික්ස් (පුද්) සමාගම නමැති පුද්ගලික සමාගමට වසර 30 කට බදු දෙන ලදී. වාර්ෂික බදු කුලිය රාජ්‍ය තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම් වේ.

මූල්‍ය ඉස්මතුකිරීම්

	2017	2016	වෙනස %
මුළු ආදායම (රු.)	326,621,778	211,395,745	54.5%
දළ ලාභය/ (අලාභය) (රු.)	(28,228,103)	(58,355,012)	51.6%
අනෙකුත් මෙහෙයුම් ආදායම් (රු.)	105,672,496	38,753,932	172.6%
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ලාභය	39,849,890	(46,082,980)	186.5%
බදු රහිත ලාභය (රු.)	37,088,435	(62,756,178)	159%
වාර්ෂික ලාභය (රු.)	37,088,435	(62,756,178)	159%
දළ ලාභ ආන්තිකය (%)	(8.6%)	(27.6%)	19%
ශුද්ධ ලාභ ආන්තිකය (%)	11.3%	(29.6%)	40.9%
කොටසක ඉපයුම (රු.)	11.69	0.73	1,501%
මුළු වත්කම් (රු.)	1,131,187,393	1,033,762,652	9.4%
මුළු හිමිකම් (රු.)	478,648,482	90,068,526	431%
නිකුත් කර ඇති කොටස් ගණන	නැත	නැත	නැත
කොටසක ශුද්ධ වත්කම	26.60	15.00	77.3%
ජංගම අනුපාතය	1:0.35	1:0.20	1.47%

ඉහත දත්ත 2017 දෙසැම්බර් 31 සහ 2016 දෙසැම්බර් 31 දින වලින් ගෙවුණු වර්ෂ සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් ලබා ගන්නා ලද අතර එය එකී මූල්‍ය ප්‍රකාශන වල අදාළ සටහන් සමඟ කියවිය යුතුය.

මෙහෙයුම් ඉස්මතුකිරීම්

	2017	2016	වෙනස %
තේ (දළු) නිෂ්පාදනය (කි.ග්රෑ)	2,711,081	2,541,465	6.67%
NSA (රු.)	91.08	64.58	41.03%
COP (රු.)	106.87	87.10	(22.69)%
අස්වැන්න (හෙක්)	644	613	5.05%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	865.78	862.78	0.34%
රබර් (කිරි) නිෂ්පාදනය (කි. ග්රෑ)	78,348	76,025	3.05%
NSA (රු.)	302,95	213.95	5.14%
COP (රු.)	475,17	369.23	(28.69)%
අස්වැන්න (හෙක්)	283	350	(19.14)%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	276.36	217.00	27.35%
පොල් නිෂ්පාදනය (ගෙඩි)	841,964	1,359,558	(38.07)%
NSA (රු.)	40.58	20.71	95.94%
COP (රු.)	29.95	14.05	(113.16)%
අස්වැන්න (හෙක්)	2,672	4,672	(42.80)%
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	315.18	291.83	(8)%

පිරිවැටුම
රු. මිලි. 327 (2016 - රු. මිලි 211)



ලාභය /(අලාභය) බදු රහිත
ලාභය රු. මිලි 37 (2016 අලාභය - මිලි 63)



කොටසක ලාභය /(අලාභය)
EPS රු. 11.69 (2016 - EPS 0.73)



කොටසක ශුද්ධ වත්කම
රු. 26.59 (2016 – රු. 15.00)



ලාභය/ (අලාභය) තත්ත්වය 1993-2017 (රු.)

වර්ෂය	ලාභය / (අලාභය)	භාණ්ඩාගාර ප්‍රදාන	මුළු ලාභය/ (අලාභය) රු.
1993	(16,158,428)	-	(16,158,428)
1994	(44,076,870)	-	(44,076,870)
1995	(32,348,831)	-	(32,348,831)
1996	(43,109,305)	-	(43,109,305)
1997	(43,387,199)	-	(43,387,199)
1998	(41,795,687)	-	(41,795,687)
1999(*)	(5,305,734)	-	(5,305,734)
2000	(16,884,862)	-	(16,884,862)
2001	(32,661,127)	-	(32,661,127)
2002	(72,197,231)	168,072,927	95,875,696
2003	(83,139,468)	105,859,000	22,719,532
2004	(78,472,241)	76,100,000	(2,372,241)
2005	(35,075,378)	70,000,000	34,924,622
2006	(49,489,141)	55,000,000	5,510,859
2007	(39,536,041)	13,000,000	(26,536,041)
2008	29,490,317	-	29,490,317
2009	(62,688,625)	-	(62,688,625)
2010(**)	(4,965,702)	-	(4,965,702)
2011	(29,733,796)	-	(29,733,796)
2012	(35,168,337)	-	(35,168,337)
2013	(64,949,088)	-	(64,949,088)
2014	30,402,163	-	30,402,163
2015	(26,922,929)	175,000,000	148,077,071
2016	(62,756,178)	75,831,000	13,074,822
2017	37,088,435	173,300,000	210,388,435

- ගිණුම්ගත කරන ලද භාණ්ඩාගාර ප්‍රදාන වල මුළු වටිනාකම රු. 912,162,927/-
- (*) හිටපු බැංකුකරුවන් වූ සෙලාන් බැංකුව මඟින් රු. මිලියන 25.9 ක් වූ සමුච්චිත පොලිය ලියාහැර දැමූ නිසා 1999 වසරේ අලාභය පහල ගියේය.
- (**) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල මඟින් උපචිත ණයකර පොලිය සඳහා අයකළ අධිභාරය වූ රු. මිලියන 35.06 ක් ලියාහැරීම හේතුවෙන් 2010 දෙසැම්බර් වන විට අලාභය අඩු විය.
- අදාළ වර්ෂ සඳහා පාරිබෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ අගය වෙනස් වීම (සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කල පසු) සහ සත්‍ය ලාභ අලාභ පහත පරිදි වේ.

  2014 - රු. 84,630,003

  2015 - රු. 680,621

  2016 - රු. 5,982,775

  2017 - රු. 51,235,672

භාණ්ඩාගාරය මඟින් ඇල්කඩුව වැවිලි සමාගම වෙත අරමුදල් නිදහස් කිරීම 1999 – 2017

වර්ෂය	විස්තරය	ප්‍රමාණය (රු.)
1993 – 2002	උපචිත ශේෂය	168,072,927
2003	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	105,859,000
2004	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	76,100,000
2005	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	70,000,000
2006	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	55,000,000
2007	ලැබුණු අරමුදල් - පුනරාවර්තන	13,000,000
2008	-	-
2009	-	-
2010	-	-
2011	-	-
2012	-	-
2013	-	-
2014	-	-
2015	ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන	175,000,000
2016	ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන	75,831,000
2017	ලැබුණු ප්‍රදානයන් - පුනරාවර්තන	173,300,000
එකතුව		**912,162,927**



සභාපතිතුමාගේ සමාලෝචනය



2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ආයතනයේ සභාපති ලෙස මා විසින් 2018 අගෝස්තු මස රාජකාරි භාරගෙන ආයතනයේ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරමි.

ඇල්කඩුව වැවිලි සමාගමෙහි පෙර කළමනාකරණ යටතේ, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමේදී සහ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් සිදු විය. කෙසේ වෙතත්, මෙම සමාගමේ සභාපතිවරයා ලෙස මා රාජකාරි භාරගත් පසු ඇල්කඩුව වැවිලි සමාගම් සාංගමික ව්‍යවස්ථාවලියේ විධිවිධාන සහ 2007 අංක 7 දරණ සමාගම් පනත මත පදනම්ව වාර්ෂික වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා සහ කාලානුරූපව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මූලික කටයුතුගෙන ඇත.

ස්තුතිය

ආයතනයේ සභාපතිවරයා ලෙස සහ ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාලෝචනයට භාජනය කල කාල පරිච්ඡේදය තුල ප්‍රධාන කාර්යාලයේ සහ වතුකරයේ කාර්ය මණ්ඩලයට සහ සේවකයින්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා මධ්‍යයේ වුවද ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා වූ කැපවීම වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.



නාලක දේවින්ද මඩවල

සභාපති

ඇල්කඩුව වැවිලි සමාගම

බාන්ඩික තොරතුරු





තේ දළු

	2017	2016	2015	2014	2013
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	78,348	76,025	82,085	94	117
NSA - රු/ කි.ග්‍රෑම්	302.95	213.95	239.73	249.34	353.88
COP - රු/ කි.ග්‍රෑම්	(475.17)	(369.23)	(335.15)	(413.54)	(372.19)
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	(172.22)	(22.52)	11.68	(27.05)	(27.15)
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	276.36	217.00	282.19	287.47	287.47

රබර් කිරි

	2017	2016	2015	2014	2013
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	2,711	2,541	4,007	3,254	3,054
NSA - රු/ කි.ග්‍රෑම්	91.08	64.58	56.63	62.37	58.58
COP - රු/ කි.ග්‍රෑම්	(106.87)	(87.10)	(68.31)	(89.42)	(85.73)
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	(15,79)	(22.52)	11.68	(27.05)	(27.15)
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	865.78	862.78	883.18	1,278.39	1,278.39

පොල්

	2017	2016	2015	2014	2013
නිෂ්පාදනය- කි.ග්‍රෑම්	842	1,360	970	1,386	519
NSA - රු/ කි.ග්‍රෑම්	40.58	20.71	27.90	28.72	18.12
COP - රු/ කි.ග්‍රෑම්	(29.95)	(14.05)	(9.53)	(10.17)	(37.12)
ලාභය/ (අලාභය) කි.ග්‍රෑම් 1කට රු.	10.63	(22.52)	11.68	(27.05)	(27.15)
ආදායම් ප්‍රමාණය - හෙක්ටෙයාර්	315.18	291.83	287.66	263.64	263.64

අධ්‍යක්ෂ මණ්ඩලය

2017 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය

1. නිලූ දිල්හාර විජේදාස මහතා - සභාපති / අධ්‍යක්ෂ
2. රාමනායකගේ මල්ලිකා ජයන්ති මිය - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
3. ජෝන් මාටින්ස්ටයින් අල්පොන්සු ඩග්ලස් මහතා - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
4. අස්වද්දගේ ගෙදර විජේතුංග මහතා - අධ්‍යක්ෂ
5. සේන ගංගොඩතැන්න මහතා - අධ්‍යක්ෂ
6. මොහොමඩ් මොහමඩ් ෆවුස් මහතා - අධ්‍යක්ෂ

2018 ජූලි 24 දින මුදල් අමාත්‍යාංශය මඟින් පත්කරන ලද වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පහත පරිදි වේ.

1. නාලක දේවින්ද මඩවල මහතා - සභාපති/ අධ්‍යක්ෂ
2. රාමනායකගේ මල්ලිකා ජයන්ති මහත්මිය - අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත
3. වික්‍රමසිංහ මුදියන්සේලාගේ ධම්මිකා තරංගනී වික්‍රමසිංහ මහත්මිය - අධ්‍යක්ෂ/ අමාත්‍යාංශ නියෝජිත
4. වන්නකුවත්ත වඩුගේ රුවිර නිශාන්ත ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
5. සේන ගංගොඩතැන්න මහතා - අධ්‍යක්ෂ
6. නිලූෂා මනෝරි තන්ත්‍රිගේ මහත්මිය - අධ්‍යක්ෂ
7. රන්ජිත් අසෝක හේරත් මහතා - අධ්‍යක්ෂ

ආයතනයේ සමාගම් විධිවිධාන වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ගණන 2 ට වඩා අඩු නොවිය යුතු අතර 7 ට වඩා වැඩි නොවිය යුතුය.සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාර ලේකම් විසින් පත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයින් ‘‘පත් කරන ලද අධ්‍යක්ෂකයින්’’ වන නිසා ඔවුන් ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යාම අවශ්‍ය නොවේ.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ කාලත්‍රයින් ආයතනයේ කොටස් වලට හිමිකම් නොකියයි.

කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ රුචිකත්වය

සමාගම වෙත ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ගේ සෘජු හෝ වක්‍රාකාර බලපෑමක් ඇති නොවේ.

කළමනාකරණ කණ්ඩායම

ජේෂ්ඨ කළමනාකාරීත්වය

නිලූ දිල්හාර විජේදාස මහතා - සභාපති/ අධ්‍යක්ෂ

කේ.බී.ආර්. පෙරේරා මහතා - සාමාන්‍යාධිකාරී (ආවරණ)

කේ.එච්. වික්‍රමසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තේ)

මධ්‍ය කළමනාකාරීත්වය

ආර්.එම්.සී. විජේරත්න මහතා - මූල්‍ය කළමනාකාර

එම්.එම්. මද්දගේ මහත්මිය - කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන

ඩී.ඒ. ඩැනියල් මහතා - කළමනාකාර - MIS සහ විශේෂ ව්‍යාපෘති

ඊ.එම්.ඒ.බී. ඒකනායක මහතා - අභ්‍යන්තර විගණක

වතු කළමනාකාරීත්වය සහ අනෙකුත්

බණ්ඩාරපොත වතුයාය

ආර්.ඒ.සී. පී. කුමාර මහතා - වතු අධිකාරී

ඩී.ඒ.ටී.එස්. අතුකෝරල මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

ඇල්කඩුව වතුයාය

ආර්. දිසාගේ මහතා - වතු අධිකාරී
ඩී.එම්.එස්.ආර්. දිසානායක මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

නාලන්ද වතුයාය

එච්.ඒ.බී.එස්.එන්. උඩුගම මහතා - වතු අධිකාරී

හුනුගල්ල වතුයාය

සී. බී නුගවෙල මහතා - වතු අධිකාරී

පිටකන්ද වතුයාය

කේ.එච්. වික්‍රමසිංහ මහතා - වතු අධිකාරී
කේ.පී.එන්.පී. කරුණාරත්න මහතා - නියෝජ්‍ය වතු අධිකාරී
සහන් රත්නායක මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

හප්පුගස්පිටිය වතුයාය

කේ.බී.ආර්. පෙරේරා මහතා - වතු අධිකාරී
එන්.එච්.ඒ.බී. යාපා මහතා- නියෝජ්‍ය වතු අධිකාරී

රත්වත්තේ වතුයාය

එම්.එල්.කේ.ආර්. සේනාරත්න මහතා - වතු අධිකාරී
හෂාන් අවුරටියගේ මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

මිල්ලවාන වතුයාය

ඩී.එස්.එන්. පෙරේරා මහතා - වතු අධිකාරී
කේ.ආර්.එස්.පී. ධර්මසේන මහතා - නියෝජ්‍ය වතු අධිකාරී

සේලගම වතුයාය

එස්.කේ.ඩී.සී. නවරත්නම් මහතා - වතු අධිකාරී

ආයතනික පාලන ප්‍රකාශය

ඒකාබද්ධ පාලනය යනු සමාගමක් මෙහෙයවන සහ පාලනය කරන නීති, පුහුණුවීම් සහ ක්‍රියාවලි පද්ධතියයි. සමාගම මූලික වශයෙන් මෙහෙයවනු ලබන්නේ අඛණ්ඩතාවය, ආයතනික සාරධර්ම, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම මත ක්‍රියාත්මක වන ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කේතයන් මත වන අතර එම පාලන මූලධර්ම සියලු පාර්ශවකරුවන් සහ සමාගම ක්‍රියාත්මක වන පරිසරය සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට උත්සහ කරන පදනම වේ. සමාගමේ ක්‍රියාකාරකම්, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ පාර්ශවකරුවන්ගේ උනන්දුව මත සිදු කෙරේ. බැඳීම ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ වෙමින් නිවැරදි භූමිකාවන්, ව්‍යුහයන් සහ තොරතුරු මතින් ශක්තිමත් වන අතර මෙය ව්‍යාපාරයේ නියාමන අනුකූලතාවය සහ තිරසාර බව සහතික කිරීම සඳහා පමණක් නොව ව්‍යාපාර වටිනාකම ඉහල නැංවීම සඳහාද දායක වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂක මණ්ඩලය අවසානයේ සමාගමේ වගකීම දරනු ලබන අතර ආයතනික පාලන ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වේ. ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ටතම භාවිතයන් ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලදී.

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගෙන් සමන්විත වේ.

වගකීම

එය ප්‍රධාන ප්‍රතිපත්ති සහ උපායමාර්ග අරමුණු සකසා ක්‍රියාත්මක කිරීම සහතික කරයි. මූල්‍ය තොරතුරු වල අඛණ්ඩතාවය සහ සමාගමේ අභ්‍යන්තර පාලනයේ පද්ධති වල ඵලදායීතාවය පිළිබඳ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වීමට නියම කර ඇත. මෙම රැස්වීම්වලදී මණ්ඩලය විසින් සමාගමේ උපායමාර්ගික දිශානතිය. වාර්ෂික අයවැය, සියලු ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සහ වර්තමාන සහ ප්‍රාග්ධන වියදම් වැඩසටහන් සමාලෝචනය කරයි. සෑම රැස්වීමකටම පෙර අදාළ ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙයි. 2017 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලය 6 වරක් රැස්වී ඇත.

විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික පාලන මාර්ගොපදේශයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත් කරයි. මූල්‍ය වාර්තාකරණය, නෛතික හා නියාමන අනුකූලතා, අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සහ බාහිර විගනකවරුන් තක්සේරු කිරීම සමාලෝචනය කිරීමට විගණන කමිටුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටුවේ සභාපති වන්නේ ශ්‍රී ලංකා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වේ. විගණන කමිටු රැස්වීම කාර්තු ලෙස පැවැත්වීමට තීරණය කර ඇත. ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන මණ්ඩල සාමාජිකයාගේ සභාපතිත්වය යටතේ විගණන කමිටු රැස්වීම නියාමනය කරනු ලබයි.

සාමාන්‍යාධිකාරීතුමා, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් සහ අනෙකුත් කළමනාකරුවන් ආරාධනය මත මෙම රැස්වීම් සඳහා සහභාගී වේ. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ආරාධනා සහ රැස්වීම් සම්බන්ධීකරණය කරයි. 2017 වර්ෂය තුල විගණන සහ කළමනාකරණ කමිටුව 4 වරක් රැස්වී ඇත.

නීතිමය අවශ්‍යතාවයට අනුකූල වීම

සමාගමේ සංදේශ සහ රජය සතු ව්‍යාපාර කටයුතු සඳහා අදාළ වන වෙනත් නීතිරීති සහ රෙගුලාසි වලට සමාගම අනුකූල වන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සෑම උත්සාහයක්ම දරයි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කර ඇති බවත් 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල බවත් මණ්ඩලය සහතික කරයි.

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ඇති විධිවිධාන වලට අනුකූලව ඇල්කඩුව වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම පිළිගනියි. විගණකාධිපති දෙපාර්තමේන්තුව ඔවුන්ගේ වාර්තා වල පිටු අංක 15 හි දක්වා ඇති වගකීම් වලට වඩා මෙම වගකීම් වෙනස් වේ.

මෙම වාර්තාවේ අන්තර්ගත සමාගමේ 2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කර ඇත. එමඟින් 2007 අංක 7 දරණ ආයතන පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන් සහ කොළඹ කොටස් ගනුදෙනු වල නීති මඟින් අපේක්ෂිත තොරතුරු සපයා ඇත. පිටු අංක 15 සිට 57 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර හා අඛණ්ඩව යොදා ගෙන ඇති බවත් අදාළ ගිණුම්කරණ සම්මතයන් අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි. මෙම සම්මත්යන්ගෙන් බැහැරව ඇති කරුණු ඇත්නම් ඒවා අනාවරණය කර විස්තර කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එළඹී තීරණ සහ තක්සේරු සාධාරණ සහ දූරදර්ශී වේ.

සමාගමේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළි කරන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගැනීම සඳහා සමාගමට ඇති වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරයි. වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන 2017 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බවටත් අවසන් වූ වර්ෂය සඳහා වූ ලාභය පිළිබඳවත් ඔවුන්ගේ වගකීම තහවුරු කරයි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය මත රඳා පවතියි. වැරදි අර්ථකතන හා වංචාවන්ට එරෙහිව නිරපේක්ෂ සහතිකයක් ලබා දිය හැකි තනි අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොමැති බව පිළිගන්නා අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර චෙක්පත්, අභ්‍යන්තර විගණනය, මූල්‍ය හා වෙනත් පාලනයන්ගෙන් සමන්විත වන අභ්‍යන්තර පාලන පද්ධති ඔවුන් විසින් ස්ථාපිත කර ඇති බව සනාථ කරයි. එමඟින් සියලු වත්කම් ආරක්ෂා කර ඇති බවට සාධාරණ සහතිකයක් පවතින අතර වැරදි අර්ථකථන සහ අක්‍රමිකතා සාධාරණ කාල සීමාවක් තුල වැලක්වීමට හෝ අනාවරණය කිරීමට හැකි වේ.

අනාගතයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගමට ප්‍රමාණවත් සම්පත් පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩව අවධානය යොමු කිරීමේ පදනම භාවිතා කර ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරීන්ට ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම සඳහා සුදුසු සහ අවශ්‍ය යැයි සලකන සමාලෝචන හා පරීක්ෂණ සිදු කිරීමට සෑම අවස්ථාවක්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත. රජයේ විගනකවරුන් වන විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලු මූල්‍ය වාර්තා හා අදාළ දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඔවුන්ගේ මත මෙම වාර්තාවේ පිටු අංක 18 හි වාර්තා කර ඇත. මෙම මතයට පැමිණීමේදී ඔවුන් විසින් අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විමර්ශනය හා සාම්පල පරීක්ෂා කිරීම සිදු කර ඇත.

මණ්ඩලය වෙනුවෙන්



සමාගම් ලේකම්
ඇල්කඩුව වැවිලි සමාගම

2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ඇල්කඩුව වතු සීමාසහිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

ඇල්කඩුව වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස් වෙනස් කිරීමේ ප්‍රකාශය සහ ගෙවුණු වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහ අනෙකුත් විස්තරාත්මක සටහන් ආදියෙන් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත වෙත ඉදිරිපත් කල යුතු යැයි හැඟෙන සමාලෝචනය කරන වර්ෂය සඳහා සමාගමේ කාර්ය සාධනය පිළිබඳ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දක්වා ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අනුව සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීමට සහ වංචාව හෝ දෝෂය හේතුවෙන් ඇතිවන මූල්‍ය වැරදි අර්ථකතනයකින් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලනය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වගකීම දරයි.

1.3 විගණන වගකීම

මාගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මතය ඉදිරිපත් කිරීමයි. මා විසින් මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන සම්මතයන්ට අනුව සිදු කරන ලදී.

1.4 සුදුසුකම්ලත් මතයේ පදනම

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 7ට අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ වල ගැලපුම් යටතේ වාර්තා කරන වර්ෂයට අදාලව පොලී ආදායම රු. 4,410,836ක් ලෙස පැවතියද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීමක් ලෙස ලැබුණු රු. 3,357,912 ක පොලී ආදායම වාර්තා නොකිරීම මඟින් ආයෝජන ක්‍රියාකාරකම් වල මූල්‍ය ප්‍රවාහය අඩුවෙන් දක්වා ඇත.

(b) මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී ලාභයට එකතු කිරීම වෙනුවට ලාභයෙන් මූල්‍යමය නොවන අයිතමයක් ලෙස සලකා අඩු කිරීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මූල්‍ය ප්‍රවාහය රු. 1,833,956 ක් වැඩිපුර දක්වා ඇත. වාර්තාකරණ වසරේ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 7ට අනුව විලම්බිත ආදායමෙන් රු. 916,978ක මුදලක් අතහැර දමා ඇත.

(c) ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මත අංක 12හි 15 වන ඡේදයට අනුව සියලු බදු වල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීම හඳුනා ගත යුතු වුවද විගණකගේ ගණනය කිරීම් වලට අනුව වාර්තා කරන වර්ෂයට අදාලව රු. 34,339,662 ක විලම්බිත බදු වගකීමක් හඳුනාගෙන හෝ මූල්‍ය ප්‍රකාශන වල දක්වා හෝ නොමැත.

(d) 1995 නිකුත් කල රු. 5,000,000 ක වටිනාකමකින් යුතු ණයකර වලට අදාළ සේවක අර්ථසාදක අරමුදල වෙත සමාගම විසින් 2000 ජුනි 15 සිට දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු රු. 12,600,000 ක පොලී වියදම් ගිණුම් වෙත රහෙන විත් නොමැත.

(e) කර්මාන්තයේ ප්‍රමිතීන්ට අනුව තේ, පොල්, රබර් සහ වෙනත් වගාවන් වල පරිනත කාලය අවුරුදු 2 සිට 6 දක්වා පැවතුනද 2002 සිට 2015 වර්ෂය දක්වා කාලය තුල ආරම්භ කරන ලද වගාවන් සඳහා ප්‍රාග්ධනීකරණය කල රු. 149,745,255 ක මුදල, සමාගමට අදාළ වතු වල කල් පිරීමේ කාල සීමාව හඳුනා ගැනීම සඳහා සමාගමට නිශ්චිත ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් හඳුනාගෙන නොමැති අතර ඒ සඳහා ක්‍රමක්ෂය ගැලපුම්ද සිදුකර නොමැත.

(f) කොස් ගස් දැව බවට පරිවර්තනය කිරීමේදී නීතිමය අවශ්‍යතා සපුරාලීම දුෂ්කර වන නිසා පරිභෝජනය කල හැකි ජෛව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමේදී වෘත්තීය තක්සේරුකරුවන් විසින් කොස් ගසේ වටිනාකම පරිභෝජනය කල හැකි ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණද සමාගම විසින් කොස් ගසක වටිනාකම රු. 115,109,263 ක් ලෙස සඳහන් කර ඇති අතර වාර්තා කරන වර්ෂයට අදාලව පරිභෝජනය කල හැකි ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම ලෙස රු. 311,900,488 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

(g) දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකමට අදාළ තොරතුරු සමාගම විසින් ලබා ගෙන නොමැති නිසා වාර්තා කරන වර්ෂය අවසාන වන විටත් රු. 87,740,383 ක වටිනාකමකින් යුතු දරන්නාගේ ජීව විද්‍යාත්මක වත්කම් මේරූ වගාවන් යටතේ හඳුනාගෙන නොමැති අතර 1993 වර්ෂයේදී සමාගම පිහිටුවීමේදී එම රු. 87,740,383 ක අගය රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් වත්කම් යටතේ දක්වා ඇත.

(h) සමාගම විසින් වාර්තා කරන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සකස් කල ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ අදාළ පාර්ශව ගනුදෙනු ලෙස සඳහන් කල යුතු මුදල රු. 2,954,419 ක් වුවත්, සමාගමේ ප්‍රධාන ශාඛාව සහ වතු අතර සිදු වූ ගනුදෙනු වලට අදාලව රු. 14,691,639 ක බර ශේෂයක් පියවා නොමැති නිසා අදාළ පාර්ශව ගනුදෙනු ලෙස රු. 11,737,219 ක හර ශේෂයක් වාර්තා කර ඇත.

(i) සමාගමේ වතු 5 ක් විසින් 2001 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ආරම්භ කල තේ පැළ තවාන් වාර්තා කරන වර්ෂය අවසාන වන විට තවදුරටත් නොපැවතුනද මේ සඳහා වැයවූ මුදල වූ රු. 2,062,559ක් වාර්තා කරන වර්ෂයේ පවතින තොග වලට අන්තර්ගත කර ඇති අතර එම අගය ගිණුම් වෙත ගෙනවිත් ඇත.

(j) සමාගම විසින් සකස් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව වාර්තා කරන වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සමාගම වෙත ලැබිය යුතු මුදල් පිලිවෙලින් රු. 1,185,670 සහ රු. 8,723,922 ලෙස ගිණුම් වෙත ඇගෙනවිත් තිබුනද අදාළ සමාගම වල මූල්‍ය ප්‍රකාශන වල එම අගයන් රු. 8,723,922 සහ 1,743,955 ලෙස පැවතුන බැවින් රු. 7,538,252 හා රු. 24,794 ක වෙනස්කම් හඳුනා ගැනුනි.

(k) සමාගම විසින් 2010 වර්ෂයේදී හලාවත වැවිලි සමාගමෙන් ලබා ගත් රු. 20,000,000 ක මූලික ණය මුදල වාර්තා කරන වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන වල රු. 22,750,674 ලෙස දක්වා තිබුණු නිසා රු. 2,750,674 ක වෙනසක් නිරීක්ෂණය විය.

(l) රු. 96,476,872 ක පිරිවැයකින් යුතු දේපල, යන්ත්‍රෝපකරණ හා ආම්පන්න වල වටිනාකම තහවුරු කරගැනීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛන සහ මෝටර් වාහන වලට අදාළ මෝටර් වාහන ලියාපදිංචි සහතික ආදී ලියකියවිලි සමාගම විසින් පවත්වා ගෙන යනු නොලැබේ.

(m) ණය ගැතියන්ගේ හා ණය හිමියන්ගේ ශේෂයන් වන රු. 77,586,179 හා රු. 1,831,975 තහවුරු කිරීම සඳහා ලිපි විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.

(n) සමාලෝචනය කරන වර්ෂය අවසානයේ අඩමාන ණය ලෙස වෙන්කර ඇති මුදල රු. 4,186,615 ක් වුවද එම අගය ගණනය කල ආකාරය හෝ අදාළ ණය ගැතියන් ප්‍රමාණය විගණනය වෙත ලබා දී නොමැත.

(o) ගිණුම් 10 ක ශේෂය වූ රු. 3,777,650 ක මුදල වෙළඳ හා අනෙකුත් ගිණුම් වලින් ලැබිය යුතු හෝ ඒවාට ගෙවිය යුතු ගිණුමේ අන්තර්ගත කර නොමැති අතර එය ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ ඇති ගිණුමකට ගෙනවිත් ඇත.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 සුදුසුකම් ලත් මතය

මෙම වාර්තාවේ ප්‍රතික්ෂේප කිරීමේ මතය සඳහා ඡේද පදනමෙහි විස්තර කර ඇති කරුණු වල වැදගත්කම නිසා, විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි වී තිබේ. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන මත මා විසින් මතයක් ප්‍රකාශ කරනු නොලැබේ.

2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ ආයතන පනතේ 163 (2) කොටසේ අවශ්‍යතා වලට අනුව මා පහත දැ සඳහන් කරමි:

(a) විගණන මතයේ පදනම, වපසරිය හා සීමාවන් මෙම වාර්තාවේ සඳහන් පරිදි වේ.

(b) සුදුසුකම් ලත් මතයක් සඳහා පදනම් ඡේදයේ විස්තර කර ඇති කරුණු වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර මගේ විභාගයෙන් පෙනී යන තාක් දුරට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා නොමැත.

මාගේ මතයට අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක

07 දරණ සමාගම් පනතේ 151 වන කොටසේ අවශ්‍යතා සමඟ සමපාත වේ.

2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීමේ පහත අවස්ථා නිරීක්ෂණය කරන ලදී.

නීති, රීති ආදිය සඳහා යොමු කිරීම	අනුකූල නොවීම
(a) 1958 අංක 15 දරණ සේවක අර්ථසාදක අරමුදලේ 15 හා 16 කොටස්	සේව්‍යයා විසින් අදාළ සේවකයින්ට අදාලව සේවක අර්ථසාදක අරමුදල වෙත අරමුදල් ඊලඟ මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතු වුවද සේවක අරමුදලට අදාළව සමාගම විසින් 2016 සහ 2017 වර්ෂ සඳහා නියමිත දිනට ගෙවීම් සිදු කර නොමැති නිසා රු. 4,331,277 ක මුදලක් දඩ මුදල් ලෙස ගෙවා ඇත.

(b) 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ i වේදයේ II කොටස	සේවකයෙකු සේවයෙන් ඉවත් වුවහොත් හෝ සේවයෙන් විශ්‍රාම ගත් විට මසක් තුල පාරිතෝෂික ගෙවිය යුතු වුවත් 1995 අප්‍රේල් 01 සිට 2017 ඔක්තෝම්බර් 31 දක්වා සේවයෙන් ඉවත් වූ සේවකයින් 1,093 දෙනෙකුට අදාලව ගෙවිය යුතු පාරිතෝෂික මුදල වූ රු. 103,300,180 ක මුදල වාර්තා කරන වර්ෂය අවසාන වන විටත් ගෙවා නොමැත.
(c) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරණ පොදු මූල්‍ය චක්‍රලේඛය	කාර්යය අවසන් වූ විගසම තාවකාලික අපගමනය සමථයකට පත් කළ යුතු වුවද, අත්තිකාරම් ලෙස. සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ අවස්ථා 14 කදී ලබාගත් රු. 1,283,048 ක් අදාළ කාර්යය අවසන් වී වසරක් ගතවී ඇතත් එම මුදල් පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. තාවකාලික අත්හිටුවීම උපරිම වශයෙන් රු. 100,000 ක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ලබා දිය හැකි අතර, අත්තිකාරම් රු. 152,000 සිට රු. 304,000 ක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකු වෙත සමාගම විසින් අවස්ථා 4කදී ලබා දී ඇත.

(d) 2009 මැයි 26 දිනැති අංක 39 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය	අනුමත වැටුප් හා දීමනාවල ඇතුළත් නොවන වැටුප් හා දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, රු. 1,045,930 ක් සමාගමේ සභාපතිවරයාට සහ වැඩබලන සාමාන්‍යාධිකාරීවරයාට "කම්කරු දීමනා" ලෙස අදාළ අනුමැතියකින් තොරව ගෙවා ඇත.
(e) 2015 මැයි 25 දිනැති අංක PED 01/2015 දරණ පොදු ව්‍යවසාය චක්‍රලේඛය	සමාගමේ සභාපතිවරයාට මාසිකව අනුමත ඉන්ධන දීමනාව ලීටර් 170 ක් වන අතර එම සීමාව ඉක්මවා යාමේදී අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා ගත යුතු වුවද වාර්තා කරන වර්ෂය තුලදී එවැනි අනුමැතියකින් තොරව අදාළ සීමාව ඉක්මවා ගිය ඉන්ධන ලීටර් 4,719 ක් සඳහා රු. 519,090 ක මුදලක් සමාගම විසින් ගෙවා ඇත.
(f) 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරණ ජාතික අයවැය චක්‍රලේඛය	මෙහෙයුම් බදු පදනම යටතේ මෝටර් වාහනයක් ලබා ගත යුතු අතර, මෝටර් රථ කුලියට දෙන ආයතනයකින් බදු පදනම යටතේ මෝටර් වාහනයක් ලබා ගත යුතු වුවද, සමාගමේ සභාපතිගේ භාවිතය සඳහා භාණ්ඩාගාර අවසරයකින් තොරව 2016 ඔක්තෝම්බර් 20 සිට 2017 ඔක්තෝම්බර් 19 දක්වා වර්ෂය සඳහා පෞද්ගලික මෝටර් වාහනයක් ලබා ගෙන ඇත.

3. මූල්‍ය විශ්ලේෂණය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචනය කරන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වල රු. 37,088,435 ක අතිරික්තයක් පවතින අතර පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 62,756,178 ක හිඟයක් පැවතුනි. මෙයින් ගම්‍ය වන්නේ පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචනය කරන වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු. 99,844,613 ක වැඩිදියුණුවක් සිදු වී ඇති බවයි. මෙම වැඩිදියුණුව සඳහා ප්‍රධාන හේතුව ලෙස පෙර වර්ෂය සමඟ සංසන්ධනය කිරීමේදී සමාලෝචනය කරන වර්ෂයේ අනෙකුත් මෙහෙයුම් භෝග වල පිරිවැය රු. 66,918,564 කින් ඉහල යාම හා ප්‍රධාන භෝග වගා කිරීමෙන් රු. 30,126,909 කින් අලාභය අඩු වීම දැක්විය හැකිය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්ත වලට අනුව 2017 වසරේ ශ්‍රී ලංකාවේ සම්මත නිමි තේ අස්වැන්න හෙක්ටෙයාරයකට කි ග්‍රෑම් 1595 ක් ලෙස පැවතියද සමාගමෙන් පරිපාලනය වන වතු 6හි වාර්ෂික තේ අස්වැන්න කි ග්‍රෑම් 390 ත් කි ග්‍රෑම් 876 ත් අතර අගයන් වල පැවතුනි. සමාගම හා සම්බන්ධව අවුරුදු 50 කට වඩා පැරණි හෙක්ටෙයාර් 447 ක වපසරියකින් යුතු බීජ තේ වගාවක් පවත්වා ගෙන යාම සහ ඉහල අස්වැන්නක් ලබා දෙන අතු තේ වගාව කෙරෙහි අකණ්ඩ අවධානය යොමු නොකිරීම අඩු අස්වැන්නක් ලැබීමට හේතු වී ඇත.

(b) සමාගමට අයත් තේ වගාවන් පවතින වතු 6 ක තේ කිලෝග්‍රෑම් 1 ක දායකත්වය වසර 5 කට වඩා වැඩි කාලයක සිට ඍණ අගයක පැවතුනි. ඒ අනුව, වාර්තා කරන වර්ෂය සඳහා දායකත්ව ඍන අගය රු. 13 ත් රු. 70 ත් අතර අගයක පැවතුනි.

(c) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්ත වලට අනුව 2017 වසරේ ශ්‍රී ලංකාවේ සම්මත නිමි තේ අස්වැන්න හෙක්ටෙයාරයකට කි ග්‍රෑම් 1595 ක් ලෙස පැවතියද සමාගමේ බාහිර පාර්ශව මඟින් පරිපාලනය කල හෙක්ටෙයාර් 334 ක භූමි ප්‍රමාණයක නිමි තේ අස්වැන්න හෙක්ටෙයාරයකට කි.ග්‍රෑම්. 6 - 89 ත් අතර අගයක පැවතුනි. ඒ අනුව, බාහිර පාර්ශව මඟින් පරිපාලනය වන තේ වගා භූමි වලින් සම්මත අස්වැන්න ලබා ගැනීමට සමාගම විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

(d) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්ත වලට අනුව වාර්තා කරන වර්ෂය සඳහා RSS 1 බාණ්ඩයේ රබර් කි. ග්‍රෑම්. 1ක සාමාන්‍ය මිළ රු. 337 ක් වුවද සමාගම විසින් පෞද්ගලික ආයතන වෙත විකුණූ රබර් කි.ග්‍රෑම් 1ක් සඳහා ලද මුදල රු. 304 ත් රු. 278 ත් අතර අගයක පැවතුනි.

(e) වාර්තා කරන වර්ෂය සඳහා සමාගම සතු වතුයායන් 4ක හෙක්ටෙයාර් 292ක වපසරියක ලැබුණු පොල් අස්වැන්න පොල් ගෙඩි 841,964 ක් වූ අතර එය පෙර වර්ෂය සමඟ සංසන්ධනය කිරීමේදී 38% ක පහල යාමකි. මෙම අස්වැන්න අඩු වීමට හේතු ලෙස අවශ්‍ය තරම් වාරි පද්ධති ස්ථාපිත නොකිරීම, මුළු පොල් වගාවෙන් 64% ක ප්‍රමාණයක භාවිතයට ගත හැකි ජීවිත කාලය ඉක්මවා ගොස් තිබීම සහ නැවත වගා කිරීම් ආරම්භ කිරීමට පමා වීම දැක්විය හැකිය.

(f) වාර්තා කරන වර්ෂය සඳහා මිල්ලවාන වතුයායේ සහ හපුගස්පිටිය වතුයායේ කොකෝවා වගාව පවතින හෙක්ටෙයාර් 45.77 ක ප්‍රමාණය සඳහා තක්සේරු කළ අස්වැන්න කි.ග්‍රෑම්. 17,000 ක් වුවද වාර්තා කරන වර්ෂය සඳහා ලද අස්වැන්න කි.ග්‍රෑම්. 2,305 ක් හෙවත් තක්සේරු කල අස්වැන්නෙන් 14% විය. කොකෝවා ශාකයක භාවිතයට ගත හැකි ජීවිත කාලය අවුරුදු 25 – 30 අතර වුවද මෙම වතුයායන් වල භාවිතයට ගත හැකි ජීවිත කාලය ඉක්මවා ගොස් තිබීම, කප්පාදු කිරීම, ජලය හා පොහොර යෙදීම අඛණ්ඩව පවත්වා නොගැනීම නිසා පෙර වර්ෂයට සාපේක්ෂව අස්වැන්න 30% කින් අඩු වී ඇත.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) 1993 සමාගම පිහිටුවීමේදී ගැසට් නිවේදනය මඟින් සමාගම වෙත ඉඩම් අක්කර හෙක්ටෙයාර් 4704 ක් ලැබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට ඉඅද්ම් වාර්තා වලට අනුව සමාගම විසින් පරිපාලනය කෙරෙන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර් 4054 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඉතිරි හෙක්ටෙයාර් 650 ක භූමි ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොමැත.

(b) වර්තමානයේදී සමාගම සතු වතුයායන්ගේ හෙක්ටෙයාර් 4054 ක භූමි ප්‍රමාණයකින් හෙක්ටෙයාර් 2624 ක පමණක් වගා කටයුතු සිදු කෙරෙන අතර වගා කටයුතු සඳහා ඉතිරි හෙක්ටෙයාර් 1429 ක භූමි ප්‍රමාණය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) 2003 වර්ෂයේදී වතු සහිත ප්‍රදේශයක් වන මාතලේ ඉදිකරන ලද ගොඩනැගිල්ල වෙත කොළඹ පිහිටි සමාගමේ ප්‍රධාන ශාඛාව ගෙන යාමට රාජ්‍ය ව්‍යවසාය කමිටුව නිර්දේශ කර තිබුනද එම නිර්දේශය වාර්තා කරන වසර අවසාන දිනය වන තුරුද ක්‍රියාත්මක වී නොමැති අතර අදාළ ගොඩනැගිල්ල අක්‍රීය තත්ත්වයේ පවතියි.

(b) මූල්‍ය අක්‍රමිකතා නිසා සේවයෙන් පහ කරන ලද වතු අධිකාරීවරයෙකු සම්බන්ධව කම්කරු කොමසාරිස් ඉදිරියේ සමාගම සහ අදාළ නිලධාරියාගේ ලිඛිත ගිවිසුම අනුව සේවයෙන් පහ කල කාලය සඳහා ගෙවිය යුතු වේතන සහ දීමනා ගෙවීමකින් තොරව අදාළ වතු අධිකාරීවරයා නැවත සේවයේ පිහිටුවනු ලැබුවද දේශපාලන පලිගැනීම් යටතේ වැටුප් හා දීමනා ලෙස ගෙවිය යුතු ලෙස නිර්දේශ කල රු. 2,694,669 ක මුදලින් රු. 1,600,000 ක මුදලක් වාර්තා කරන වර්ෂය තුලදී ගෙවා ඇත.

(c) 2010 වසරේ සිදු කරන ලද අක්‍රමිකතා 15කින් 14කට වරදකරු ලෙස සමාගම විසින් සිදු කරන ලද විනය පරීක්ෂණයකදී තහවුරු වූ වතු අධිකාරීවරයෙකු 2013 වසරේදී සේවයෙන් පහ කලද ගෙවිය යුතු වැටුප් හා දීමනා ගෙවීමකින් හෝ විනය අධිකාරියේ ක්‍රියාමාර්ග ලබා නොගෙන 2013 සම්තම්බර් මස 27 වන දින නැවත සේවයේ පිහිටුවා ඇත. දේශපාලන පලිගැනීම් වන්දි ලෙස සේවයෙන් පහ කල කාලය සඳහා ගෙවීමට තීරණය කල රු. 1,304,119 ක වැටුප් හා දීමනා වලින් රු. 785,000 ක මුදලක් වාර්තා කරන වර්ෂයේදී ගෙවා ඇත.

(d) ඇල්කඩුව වතුයායට අයත් රත්වත්තේ වතුයායේ ක්වාර්ටිස් නිධියකින් ක්වාර්ටිස් කියුබ් 1ක් ලෙස අවුරුදු 5 ක කාලයක් සඳහා අගය එකතු කල බදු සහ ජාතික ගොඩනැගිලි බදු ඇතුලත්ව රු. 13,650 කට මිලදී ගැනීමට එකඟ වී තිබුනද 2018 ජනවාරි සිට ජුනි 14 දක්වා කාලය තුල ක්ෂේත්‍රයෙන් ඉවත් කල කියුබ් 164.47 කින් කියුබ් 59.85 ක් පමණක් සඳහා රු. 13,650 ක මුදලක් ගෙවා ඇති අතර ඉතිරි ක්වාර්ටිස් කසළ ක්වාර්ටිස් ලෙස හඳුනා ගැනීම නිසා ඉතිරි ක්වාර්ටිස් කියුබ් 104.62 ක ප්‍රමාණය කියුබ් 1කට 13,650 ක මුදලක් ගෙවීමකින් තොරව මුළු මුදලක් ලෙස රු. 1000 ගෙවා බදුකරු විසින් ක්ෂේත්‍රයෙන් ඉවත් කර ඇත.

(e) නෙල්ලඋල්ල වතුයායේ හෙක්ටෙයාර් 233 ක වපසරියක් සහ සමාගමට අයත් භූමියෙන් හෙක්ටෙයාර් 358 ක් අනවසර පදිංචිකරුවන් 255 දෙනෙකු විසින් අත්පත් කරගෙන ඇති අතර ඔවුන් නැවත පදිංචි කිරීමට හෝ එම ඉඩම් කැබලි බදු ලෙස ඔවුන්ට ලබා දීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

(f) 2006 වසරේදී සමාගමට අයත් බණ්ඩාරපොත තේ කර්මාන්තශාලාව අවුරුදු 30ක් සඳහා පෞද්ගලික සමාගමකට කුලියට දෙන ලද අතර බදුකරු විසින් බදු ගෙවා නොමැති වීම නිසා වාර්තා කරන වර්ෂයේ අවසාන දිනය වන විට ගෙවිය යුතු රු. 27,028,579 ක බදු මුදල අයකර ගැනීමට සමාගම විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගේම නොමැත.

4.4 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

සමාගමට අයත් කර්මාන්තශාලා 5න් 2ක් අක්‍රීය තත්ත්වයේ පවතින අතර අදාළ කර්මාන්තශාලා වලින් නිෂ්පාදන ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමට හෝ එම කර්මාන්තශාලා බදු පදනම මත ලබා දීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

4.5 පිරිස් පරිපාලනය

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

(a) සමාලෝචනය කරන වසර අවසාන වන විට එක තනතුරකට අදාලව පුරප්පාඩුවක් පවතින අතර තවත් තනතුරකට අදාලව අනුමත ප්‍රමාණයට වඩා වැඩිපුර නිලධාරියෙකු සිටියි. තවද, අනුමත පුරප්පාඩු වල අන්තර්ගත නොවන නිලධාරීන් දෙදෙනකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත.

(b) 2012 සිට සාමාන්‍යාධිකාරී තනතුරට බඳවා ගැනීමේ ක්‍රමවේද භාවිතා කර පුරප්පාඩුව සඳහා සාමාන්‍යාධිකාරී තනතුරට ස්ථිරව නිලධාරියෙකු බඳවා ගෙන නොමැති අතර කොන්ත්‍රාත් පදනම හා ආවරණය කිරීමේ පදනම මත නිලධාරීන් බඳවා ගෙන ඇත.

(c) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට අනුමත පුරප්පාඩු ගණන 1ක් වුවත් 2017 සැප්තැම්බර් සිට මෙම තනතුරට පුද්ගලයින් 3 දෙනෙකු බඳවා ගෙන ඇත.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය කරන ලද පද්ධතිවල සහ පාලනයේ දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇත. පහත පාලන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන අංශ	නිරීක්ෂණ
(a) ස්ථාවර වත්කම් කළමනාකරණය	බාහිර පුද්ගලයින්ගෙන් ඉඩම් නිදහස් කිරීම, වාහන නඩත්තු කිරීම හා වාහන රක්ෂණ දුර්වල මට්ටමක ඇත.
(b) අයවැය පාලනය	අයවැය මහින් ඉලක්ක ඇති කර ඇති නමුත් ඒවා ලගා කර ගැනීමේ සුපරීක්ෂක ක්‍රියාවලිය දුර්වල මට්ටමක ඇත.
(c) ණය ගැතියන් හා ණය හිමියන් පාලනය	දීර්ඝ කාලීන ණය ශේෂයන් පියවීමට හෝ ලබා ගැනීමට ක්‍රියා කර නොමැත.
(d) පිරිස් පරිපාලනය	බඳවා ගැනීමේ ක්‍රමවේදයට පරිබාහිරව බඳවා ගැනීම් සිදු කර ඇත.



ඒ.එම්. සදකතුල්ලා
නියෝජ්‍ය විගණකාධිපති

ඇල්කඩුව වතු සීමාසහිත සමාගම
2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		දෙසැම්බර් 31	
වත්කම්	**සටහන්**	**2017**	**2016**
ජංගම නොවන වත්කම්		**රු.**	**රු.**
කල්බදු දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න	01	153,511,897	157,833,041
සින්නක්කර දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න	02	51,661,316	50,112,678
ධාරක ජීව විද්‍යාත්මක වත්කම්	03	401,461,611	383,698,868
පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්	04	311,900,488	278,565,316
මූල්‍ය ආයෝජන	05	45,361,958	44,372,810
මුළු ජංගම නොවන වත්කම්		**963,897,270**	**914,582,712**
ජංගම වත්කම්			
තොග	06	7,161,241	5,896,023
විකුණුම් හා ලැබිය යුතු දේ	07	105,996,003	105,897,087
මුදල් හා මුදල් වලට සමාන දේ	08	54,132,879	7,386,830
මුළු ජංගම වත්කම්		**167,290,123**	**119,179,940**
මුළු වත්කම්		**1,131,187,393**	**1,033,762,652**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධනය	09	180,000,010	180,000,010
රඳවාගත් ඉපැයුම්		298,648,472	90,068,526
මුළු හිමිකම්		**478,648,482**	**270,068,536**
ජංගම නොවන වගකීම්			
බදු කොන්දේසි මත බැඳීම් - වත්මන් පරිනත	10	37,425	37,425
විලම්බිත ආදායම	11	27,261,212	28,178,190
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	12	159,052,619	150,101,630
මුළු ජංගම නොවන වගකීම්		**186,351,256**	**178,317,245**
ජංගම වගකීම්			
ගැනුම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	13	302,444,877	426,206,070
අදාළ ආයතන වෙත ගෙවිය යුතු ප්‍රමාණ	14	(11,737,219)	3,033,727
මුදවා ගත හැකි ණයකර	15	5,000,000	5,000,000
කෙටි කාලීන ලබා ගත් දෑ	16	67,178,460	64,132,331
බදු කොන්දේසි මත බැඳීම් - ශුද්ධ වත්මන් පරිනත	10	1,357	1,357
ගෙවිය යුතු පාරිතෝෂිකය	12	103,300,180	87,003,386
මුළු ජංගම වගකීම්		**466,187,655**	**585,376,871**
මුළු කොටස් හා වගකීම්		**1,131,187,393**	**1,033,762,651**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සමඟ ගැළපේ.

FINANCE MANAGER

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකියයි.
ඇල්කඩුව වතු සීමාසහිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

DIRECTOR

DIRECTOR

4 සිට 30 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි.

ඇල්කඩුව වතු සීමාසහිත සමාගම

2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය	
		2017	**2016**
		රු.	රු.
ආදායම්	**17**	326,621,778	211,395,745
විකුණුම් පිරිවැය		(354,849,881)	(269,750,756)
දල ලාභය/(අලාභය)		**(28,228,103)**	**(58,355,012)**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	**18**	105,672,496	38,753,932
පරිපාලන වියදම්	**19**	(37,594,503)	(26,481,901)
මෙහෙයුම් ලාභය/ අලාභය		**39,849,890**	**(46,082,980)**
අනෙකුත් වියදම්	**20**	(217,004)	(10,329,290)
මූල්‍ය ගාස්තු වලට පෙර ලාභය/ (අලාභය)		**39,632,886**	**(56,412,270)**
මූල්‍ය ආදායම	**21**	4,410,836	2,340,664
මූල්‍ය වියදම	**22**	(6,955,287)	(8,684,572)
ශුද්ධ මූල්‍ය ආදායම		**(2,544,450)**	**(6,343,908)**
බදු රහිත ලාභය/ අලාභය		**37,088,435**	**(62,756,178)**
ආදායම් බදු වියදම	**23**	-	-
බදු සහිත ලාභය/ (අලාභය)		**37,088,435**	**(62,756,178)**
රජයේ දීමනා - පුනරාවර්තන	**24**	173,300,000	75,831,000
වර්ෂය සඳහා ලාභය/ (අලාභය)		**210,388,435**	**13,074,822**
අනෙකුත් විස්තීරණ ආදායම්		-	-
වර්ෂය සඳහා මුළු අනෙකුත් විස්තීරණ ආදායම් එකතුව, බදු රහිත		-	-
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**210,388,435**	**13,074,822**
කොටසක ලාභය - මූලික හා තනුක	**25**	11.69	0.73

2017 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා කොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ඉපැයුම්	එකතුව
